ජාත්‍යන්තර පාසල් පුස්තකාලයාධිපතීන්ගේ සංගමය International Association of School Librarianship (IASL) මඟින් ප්‍රකාශයට පත් කරන ලද වෘත්තීය පුවත්පතක් (Professional Journal) වන 'School Libraries Worldwide' හි පළ කරන ලද ලිපියක් පරිවර්තනය කිරීම.



පාසල් පුස්තකාල කමිටු 2018/2019, ශ්‍රී ලංකා පුස්තකාල සංගමය

කැඳවුම්කරු : ඩී. ආර්. චන්දිමා දිසානායක මිය
email : chandimadiss5@gmail.com

උපදේශන සහාය : උපාලි අමරසිරි මයා

**Title**

**'Adding value: Principal's perception of the Role of Teacher Librarians'** by Mandy Lupton. In Vol. 22, No. 1, January 2016, pp. 49-62

සිංහල පරිවර්තනය - Sinhalese Translation

කේ. ජී. ජී. විජේවීර [B.Sc. (Hons)] විසින් සිංහලට පරිවර්තනය කරන ලදී.

# අගය එකතු කිරීම : ගුරු පුස්තකාලයාධිපතීන්ගේ භූමිකාව පිළිබඳ විදුහල්පතිවරුන්ගේ සංජානනය

මැන්ඩි ලුප්ටන්

ක්වීන්ස්ලන්ත තාක්ෂණික විශ්වවිද්‍යාලය

ඕස්ට්‍රේලියාව

මෙම පත්‍රිකාව ගුරු පුස්තකාලයාධිපතීන්ගේ භූමිකාව පිළිබඳ විදුහල්පතිවරුන්ගේ සංජානනය සම්බන්ධ අධ්‍යයනයක් වාර්තා කරයි. මෙහිදී ගුරු පුස්තකාලයාධිපතීන් සහ ඔවුන්ගේ පාසල්වල පුස්තකාල පිළිබඳ ඕස්ට්‍රේලියාවේ විදුහල්පතිවරුන් නව දෙනෙකු සම්මුඛ පරීක්ෂණයට බඳුන් කර ඇත. ගුරු පුස්තකාලයාධිපතීන් පාසල වෙත වටිනාකම එකතු කරන ආකාර පරාසයක් මෙහි ප්‍රතිඵලවලින් අනාවරණය විය. ගුරුවරයකු ලෙස ඔවුන්ගේ භූමිකාව, පාසල් වැඩ කටයුතු පිළිබඳ පුළුල් පර්යාලෝකයක් විදුහල්පතිට සැපයීම, උපදෙස් සහ අදහස් සැපයීම මෙන්ම පාසලේ තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය භාවිතයේ දී නායකත්වය සැපයීම ඊට ඇතුළත් වේ. එමෙන්ම එයින් විදුහල්පති විසින් අගය කළ පුද්ගල ගුණාංග ගණනාවක් හඳුනා ගැනිණ.

## හැඳින්වීම

ඔස්ට්‍රේලියාවේ ගුරු පුස්තකාලයාධිපතිත්වය පවතිනුයේ පරිවර්තනීය යුගයකය. අප ජාතික විෂය මාලාවක් (ACARA,2014) ක්‍රියාත්මක කිරීමේ නව යුගයක් වෙතට යොමු වී සිටිය ද බොහෝ අවස්ථාවල පාසල් ප්‍රජාව විසින් ගුරු පුස්තකාලයාධිපතීන් ආන්තිකකරණයට ලක් කර ඇති බව පෙනේ. මෙම තත්ත්වයට ප්‍රතිචාරයක් ලෙස පාර්ශ්වීය වශයෙන් පාසල් පුස්තකාල හා ගුරු පුස්තකාලයාධිපතිත්වය සම්බන්ධව විමසීමට ඔස්ට්‍රේලියානු රජය විසින් සෙනෙට් සභාවක් ස්ථාපිත කරන ලදී. නව පාසල් පුස්තකාල ගොඩනැගිලිවල සේවයේ යෙදවීමට සුදුසුකම් ලත් ගුරු පුස්තකාලයාධිපතීන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් නොමැති බවත් ඒවා සඳහා එකතුන් ගොඩනැංවීමට ප්‍රමාණවත් අරමුදල් නොමැති  බවත් ඔස්ට්‍රේලියානු රජය අනාවරණය කර ගන්නා ලද්දේ ඉන් පසුවය. මෙම විමසුමට පසුව සිදු කළ පර්යේෂණවලින් තහවුරු වූයේ ඔස්ට්‍රේලියාවේ පාසල් පුස්තකාල ගණනාවකට සුදුසුකම් ලත් ගුරු පුස්තකාලයාධිපතීන් නොමැති බවය. (Hughes et.al.2013)

උදා: සුදුසුකම් ලත් ගුරුවරුන් සහ සුදුසුකම් ලත් පුස්තකාලයාධිපතීන්

ගුරු පුස්තකාලයාධිපතීන්ගේ භූමිකාව ගැටලුකාරී බව ඔස්ට්‍රේලියානු සෙනෙට් සභා විමසුමෙන් අනාවරණය විය. පංති කාමරයෙන් ඉවත් කර පුස්තකාලයේ සේවයට යොදවා තිබූ දුර්වල කාර්යසාධනයක් සහිත ගුරුවරයෙකු ලෙස ගුරු පුස්තකාලයාධිපතීන් දකින බවට යෝජනා විය. සියලු පුස්තකාලයාධිපතීන්ට වේදනා ගෙන දෙන මූලාකෘතියක් ද මෙම විමසුමෙන් අනාවරණය කෙරිණ. ඒ අනුව පුස්තකාලයාධිපතීන් මුතු ඇටයේ මකරෙකි පොත් ආරක්ෂා කරන සහ මිනිසුන් නිහඬ කරන නිවුන් කට්ටලයකින් සහ මුතුවලින් සැරසුණු වයස්ගත කාන්තාවකි. (Commonweath by Austalia, 2011, p.65)

ජාත්‍යන්තර වශයෙන්, ගුරු පුස්තකාලයාධිපතීන්ගේ භූමිකාව එහි තනතුරු නාමයේ, සුදුසුකම්වල, සංජානනයේ සහ අපේක්ෂාවන්හි වෙනස්කම් මගින් බලපෑමට ලක්ව ඇත. (Barnett, 2015) 'පාසල් පුස්තකාලයාධිපතීන්' පාසල් පුස්තකාල මාධ්‍ය විශේෂඥ (American Library Association, 2010) සහ වඩාත් මෑත කාලීනව 'මාධ්‍ය සහ අධ්‍යාපනික තාක්ෂණ උපදේශක' එලෙස භාවිත තනතුරු නාමයන් වේ. (Cooper, 2015: Easley සහ Yelvingtom, 2015) සමහර බල ප්‍රදේශවලට පමණක් ඉගැන්වීම සහ පුස්තකාලයාධිපතිත්වය යන සුදුසුකම් දෙක ම අවශ්‍ය වේ. (Ash-Argule සහ Shoham, 2012: Church, Dickson, Everhart iy Howard, 2012; Lo et. Al; 2014; Shu, 2014) තව ද, ඔස්ට්‍රේලියාවේ ප්‍රතිමානය පරිදි සියලු රටවල සහ බල ප්‍රදේශවල පුස්තකාල නොමැත. (Campello, 2014; Kachel, 2015)ගුරු පුස්තකාලයාධිපතීන්ගේ, පාසල් පුස්තකාලයාධිපතීන්ගේ සහ පාසල් පුස්තකාල මාධ්‍ය විශේෂඥයන්ගේ සුදුසුකම් අවශ්‍යතා සහ තත්ත්වය වෙනස් වන නිසා

ඔවුන්ගේ භූමිකාව පිළිබඳ පර්යේෂණ අදාළ බල ප්‍රදේශය මත විශාල වශයෙන් රඳා පවතී. එහෙයින් මෙම වාර්තාවේ ප්‍රතිඵල අනෙක් බල ප්‍රදේශවලට අත්‍යවශ්‍යයෙන් ම සාමාන්‍යකරණය කළ නොහැකිය.

## ගුරු පුස්තකාලයාධිපතීන් පිළිබඳ විදුහල්පතිවරුන්ගේ සංජානනය සම්බන්ධ පර්යේෂණ

පාසලේ දී පාසල් පුස්තකාලය සහ ගුරු පුස්තකාලයාධිපති සහාය ලබන (හෝ නොලබන) ආකාරය සඳහා ගුරු පුස්තකාලයාධිපතීන්ගේ භූමිකාව පිළිබඳ විදුහල්පතින්ගේ සංජානනය තීරණාත්මක වේ. ගුරු පුස්තකාලයාධිපතීන්ගේ භූමිකාව පිළිබඳ විදුහල්පතින්ගේ සංජානනයන් වෙතට කැපී පෙනෙන පර්යේෂණ දේහයන් දෙකක් පවතී. පළමු දේහය ගුණාත්මක සමීක්ෂණ දත්ත වෙත ද දෙවැන්න සම්මුඛ සාකච්ඡා වෙත ද අවධානය යොමු කරයි. මෙම පර්යේෂණ සියල්ලම පාහේ සිදු කර ඇත්තේ එක්සත් ජනපදයේ ය.

විදුහල්පතීන්ගේ සංජානනයන් පිළිබඳ පවත්නා පර්යේෂණ බහුතරයක් එක්සත් ජනපද ජාතික පාසල් පුස්තකාල මාර්ග දර්ශක (American Association of School Librarians and Association for Communication and Technology, 1988) සහ පාසල් පුස්තකාලවල සහයෝගිත්ව හවුල්කාරිත්වයන් පිළිබඳ මාර්ග දර්ශක (American Association of School Librarians and Technology, 1998) වැනි පවත්නා රාමුවක් මගින් පූර්ව නිර්වචනිත ප්‍රශ්නාවලි අයිතමයන්ට දක්වන ප්‍රතිචාරයන් මත පදනම් වී ඇත. නිදසුනක් ලෙස, ඇරිසෝනාවේ (1989) සහ මිසුරිහි (Dorrell සහ Lawson, 1995) විදුහල්පතිවරුන් එකතු සංවර්ධනය, පුස්තකාල කළමනාකරණය, විමර්ශන සේවා සහ කියවීම් ප්‍රවර්ධනය ඇගයීමට ලක් කර තිබේ. මෙම අධ්‍යයන දෙකෙහි දී ම ඉගැන්වීම (උදාඃ පාසල් පුස්තකාලයාධිපතීන්ගේ උපදෙස් දීමේ භූමිකාව) ඇගයීමට බඳුන් කර නොමැත. තොරතුරු සාක්ෂරතාව, සහයෝගීතාව/ නායකත්වය/ තාක්ෂණය/ ඉගෙනුම/ ඉගැන්වීම, තොරතුරු වෙත ප්‍රවේශය/බෙදා හැරීම සහ වැඩසටහන් පරිපාලනයට සම්බන්ධව පාසල් පුස්තකාල මාධ්‍ය විශේෂඥයාගේ භූමිකාව ඇගයීම සඳහා කෙන්ටකිහි කරන ලද අධ්‍යයනයක දී මෙම සියලු ප්‍රවර්ගවලට ඇති තරා මට්ටම මධ්‍යස්ථ බව අනාවරණය වී ඇත. (Alexander, Smith & Carey, 2003) මෙහි දී වෙනස් අංශවල විදුහල්පතිවරුන් භූමිකාවන් සඳහා වෙනස් අයුරින් බර තබා ඇත. නිදසුනක් ලෙස, උසස් පාසල්වල විදුහල්පතිවරුන් ප්‍රාථමික පාසල්වල විදුහල්පතිවරුන්ට වඩා තොරතුරු සාක්ෂරතාවට බර තබා ඇත. දකුණු කැරොලිනාහි දී Shanon (2009) අනාවරණය කර ඇත්තේ භූමිකාවේ වඩාත් වැදගත් අංශ ලෙස විදුහල්පතිවරුන් සහයෝගීතාව, එකතු සංවර්ධනය, සහ කියවීම් ප්‍රවර්ධනය හා තොරතුරු සාක්ෂරතාව තරා කර ඇති බවය. කියවීම් අභිප්‍රේරකයෙකු, උපදේශාත්මක සම්පත් කළමනාකරුවකු, සම ගුරුවරයෙකු කාර්යමණ්ඩලයට වෘත්තීය සංවර්ධනය සපයන්නෙකු, නායකයෙකු, ගුරුවරයෙකු සහ තාක්ෂණ උපදේශකයෙකු ලෙස දකුණු කැරොලිනාහි විදුහල්පතිවරුන් පාසල් පුස්තකාලයාධිපතීන්ගේ වටිනාකම පිළිවෙළින් තරා කර ඇති බව Gavigan සහ Curry Lance (2015) වඩාත් මෑතක දී කරන ලද අධ්‍යයනයකින් අනාවරණය කර ඇත. වර්ජිනියාහි දී පාසල් පුස්තකාල මාධ්‍ය විශේෂඥයාගේ උපදේශාත්මක භූමිකාව පිළිබඳ ප්‍රාථමික

(Church, 2008) සහ ද්විතීයික (Church, 2010) විදුහල්පතිවරුන්ගෙන් විමසන ලදී. මෙම අංශ දෙකෙහි ම විදුහල්පතිවරුන් පාසල් පුස්තකාල මාධ්‍ය විශේෂඥයා ඇගයීමට ලක් කර ඇත්තේ තොරතුරු සාක්ෂරතා උපදේශකයෙකු, උපදේශාත්මක හවුල්කරුවකු, සහ තොරතුරු සාක්ෂරතා වෘත්තීය සංවර්ධනය සපයන්නෙකු ලෙසය. එහෙත් පාසල් පුස්තකාල මාධ්‍ය විශේෂඥයා කියවීම් ප්‍රවර්ධන භූමිකාවට පමණක් සීමා වීම සහ තාක්ෂණ විශේෂඥයෙකු ලෙස කටයුතු නොකිරීම ගැන ප්‍රාථමික අංශයේ විදුහල්පතිවරු විවේචනාත්මක වී ඇත. (Church, 2008, 2010)

විදුහල්පතිවරුන් විසින් අගය කරන ලද ගුණාංග ද ගවේෂණය කළ ගුණාත්මක අංශ මෙම ඇතැම් අධ්‍යයනයන්ට ඇතුළත් වේ. ආරාධනාශීලී වීම, ළඟාවිය හැකි වීම, නම්‍යශීලී වීම, සහ කණ්ඩායම් ක්‍රීඩකයෙකු වීම වැනි අන්තර් පුද්ගල කුසලතා විදුහල්පතිවරුන් යෝග්‍ය ලෙස දුටු බව Shanon (2009) අනාවරණය කළේය. මේ ආකාරයට, ප්‍රාථමික පාසල්වල විදුහල්පතිවරුන් (Church, 2007) ආරධනාශීලී වීම, සහයෝගී බව, යාවජීව ඉගෙනුම්කරුවෙකු වීම සහ විනෝදය, උද්‍යෝගය හා ආරධනාශීලී පුස්තකාලයක් නිර්මාණය කළ කණ්ඩායම් ක්‍රීඩකයෙකු වීම අගය කරන ලද අතර ද්විතීයික පාසල්වල විදුහල්පතිවරුන් ළඟා විය හැකි වීම, පාරිභෝගික සේවාභිමුඛ වීම, උද්‍යෝගිමත් බව, මිත්‍රශීලී වීම සහ නවෝත්පාදන බව සහිත පාසල් පුස්තකාලයාධිපතීන් ඇගයීමට ලක් කර ඇති බව (Church, 2007) අනාවරණය කළේය.

ඉහත සඳහන් කරන ලද අධ්‍යයනයන්ගේ දුර්වලතාවන් වන්නේ ඒවා පූර්ව නිශ්චිත භූමිකා කට්ටලයක් භාවිතයෙන් සැලසුම් කර තිබීමත් එහෙයින් විදුහල්පතිවරුන් විසින් සංජානනය කරන ලද්දක් ලෙස මතුවන භූමිකාවන් සඳහා අවකාශයක් නොමැති වීමත්ය. මිනසෝටාහි විදුහල්පතිවරුන්ගේ සංජානනය පිළිබඳ Krueger (2015) විසින් මෑතක දී කරන ලද ගුණාත්මක අධ්‍යයනයන් මෙම ගැටලුව ආමන්ත්‍රණය කර ඇත. මෙහි දී Krueger ප්‍රාථමික සහ ද්විතීයික පාසල්වල විදුහල්පතිවරුන් හයදෙනෙකු සම්මුඛ සාකච්ඡාවට බඳුන් කර තිබේ. මේ අනුව ස්වකීය මාධ්‍ය විශේෂඥයන් ඇගයීමට ලක් කර ඇත්තේ කෙසේ ද යනුවෙන් විදුහල්පතිවරුන්ගෙන් විමසීමක් කෙරිණි. විශේෂයෙන් තාක්ෂණික සංවර්ධනය සම්බන්ධයෙන් කාර්යමණ්ඩල සංවර්ධනය සපයන්නෙකු ලෙසත් තාක්ෂණයේ, සිදුවීම් සැලසුම්කරණයේ, විෂයමාලා සමෝධානයේ සහ සන්නිවේදනයේ අර්ථයෙන් පාසලේ නායකයෙකු ලෙසත් තනි පුද්ගලයන් සහ පංතියේ කණ්ඩායම් සමඟ කටයුතු කරන ගුරුවරයෙකු ලෙසත් විදුහල්පතිවරුන් මාධ්‍ය විශේෂඥයා අගය කළ බව ඔහු අනාවරණය කර ගත්තේය.

ඔස්ට්‍රේලියාවේ දී ගුරු පුස්තකාලයාධිපතීන්ගේ භූමිකාව පිළිබඳ විදුහල්පතිවරුන්ගේ සංජානනයට සම්බන්ධ පෙර දී කරන ලද ආනුභවික පර්යේෂණ සුළු ප්‍රමාණයක් ඇත. ගුරු පුස්තකාලයාධිපතීන් මෙන් ම විදුහල්පතිවරුන් විසින් සංජානනය ලෙස ගුරු පුස්තකාලයාධිපතීන්ගේ බලපෑමේ මට්ටම ගවේෂණය කළ ගුණාත්මක සහ ගවේෂණාත්මක අධ්‍යයනය ව්‍යාතිරේඛයකි. වෘත්තීය බලපෑමේ ශක්තිමත් මට්ටමක සිටින්නන් ලෙස ස්වකීය වෘත්තීය ප්‍රජාව දූනටමත් දන්නා පුද්ගලයන් ලෙස මෙම අධ්‍යයනයෙන් ගුරු පුස්තකාලයාධිපතීන් හඳුනා ගැණිනි. මෙම අධ්‍යයනයට සහභාගී වූ විදුහල්පතිවරුන් සිව් දෙනෙකු ''පුද්ගලයා සහ තනතුරු ඉහළ ඇගයීමක තබා ඇත.'' (12පි.) කෙසේ

වෙතත්, පාසල තුළ ගුරු පුස්තකාලයාධිපති සිදු කරන බලපෑම් මට්ටම මත පදනම්ව ඇති හෙයින් ගුරු පුස්තකාලයාධිපතීන්ගේ භූමිකාව පිළිබඳ විදුහල්පතිගේ සංජානනයට සම්බන්ධ පැහැදිලි විශ්ලේෂණයක් එහි නොවීය. තව ද, මෙම අධ්‍යයනය සිදු කර ඇත්තේ ගුරු පුස්තකාලයාධිපතීන්ගේ භූමිකාව පරිවර්තනයකට ලක් කළ පෘථුල තාක්ෂණික සංවර්ධනයන්ට පෙරය. ක්වින්සලන්තයේ පාසල් 27ක ශිෂ්‍ය සාක්ෂරතා සංවර්ධනයට ගුරු පුස්තකාලයාධිපතීන් දායක වන ආකාරය වඩාත් මෑත කාලීන සමීක්ෂණ පාදක අධ්‍යයනයකින් ගවේෂණය කර ඇත. (Wughes, et. Al, 2013) ගුරු පුස්තකාලයාධිපතීන්ගේ බලපෑම පිළිබඳ විදුහල්පතිවරුන්ගේ සංජානනය අනාවරණය කිරීමට මෙම අධ්‍යයනයේ සංරචකයන් විවෘත ප්‍රශ්න භාවිත කර තිබේ. මෙම අධ්‍යයනයෙන් අනාවරණය වූයේ විදුහල්පතිවරුන් විසින් ගුරු පුස්තකාලයාධිපතීන් ඉගැන්වීම් ක්‍රම විද්‍යාත්මක හා විෂයමාලා නායකයෙකු, සාක්ෂරතා නායකයෙකු සහයෝගී සාක්ෂරතා ගුරුවරයෙකු, තොරතුරු හා ඩිජිටල්/ තොරතුරු සන්නිවේදන තාක්ෂණ ප්‍රවර්ධකයෙකු, කියවීම් ප්‍රවර්ධකයෙකු, සමපදස්ථ අධ්‍යාපනඥයෙකු, සම්පත් විශේෂඥයෙකු, ඉගෙනුම් අවකාශ තනන්නෙකු සහ පර්යේෂකයෙකු ලෙස දකින ලද බවය.

ඕස්ට්‍රේලියානු රජයේ සෙනෙට් විමසුමෙහි සොයා ගැනීම් සහ ඔස්ට්‍රේලියාවේ ගුරු පුස්තකාලයාධිපතීන්ගේ භූමිකාව පිළිබඳ විදුහල්පතිවරුන්ගේ සංජානනය සම්බන්ධයෙන් කර ඇති පර්යේෂණවල අඩුව හේතු කොට ගෙන පර්යේෂණ වැඩි වශයෙන් සිදු කිරීම අවශ්‍ය බව පැහැදිලිය. මෙම පත්‍රිකාවෙන් වාර්තා කර තිබෙන අධ්‍යයනය මෙම පර්යේෂණ දේහයේ පරතරය සම්පූර්ණ කිරීම අරමුණු කර ඇත.

## ගුරු පුස්තකාලයාධිපතීන්ගේ භූමිකාව පිළිබඳ විදුහල්පතිවරුන්ගේ සංජානනය විමසීම

ගුරු පුස්තකාලයාධිපතීන්ගේ භූමිකාව පිළිබඳ විදුහල්පතිවරුන්ගේ සංජානනය කුමක් ද? යන පැනය මෙම අධ්‍යයනයෙන් විමර්ශනය කර ඇත. ඔස්ට්‍රේලියාවේ ක්වින්ස්ලන්ත ප්‍රාන්තයේ රජයේ පාසල්වල විදුහල්පතිවරුන් පස් දෙනෙක් ද, (N= 5) පෞද්ගලික පාසල්වල විදුහල්පතිවරුන් සිව් දෙනෙක් ද (N=4) ස්වේච්ඡාවෙන් මෙම අධ්‍යයනයට සහභාගී වූහ. මෙම පාසල් වසර කාණ්ඩ විවිධත්වයක් සහිත දළ වශයෙන් 500 1800 දක්වා සිසුන්ගෙන් සමන්විත පරාසයකින් යුක්ත විය. මේ අනුව K - 7 දක්වා පාසල් තුනක් ද K- 12 දක්වා පාසල් තුනක් ද 8 12 දක්වා පාසල් දෙකක් ද 10 12 දක්වා පාසලක් ද මීට අයත් විය. විදුහල්පතිවරුන් වෙත ප්‍රවේශ වන ලද්දේ ගුරු පුස්තකාලයාධිපති මගින් නිසා මෙම අධ්‍යයනය ස්වකීය ගුරු පුස්තකාලයාධිපතීන්ට සහාය ලබා දෙන විදුහල්පතිවරුන් වෙතට නැඹුරු වී ඇත.

මෙහි දී දළ වශයෙන් විනාඩි 30 ක කාල පරාසයක් සහිත අර්ධ ව්‍යුහගත සම්මුඛ සාකච්ඡා පැවැත්විණි. (විදුහල්පතිගේ කාල සටහන හේතුවෙන් එක් සම්මුඛ සාකච්ඡාවක් විනාඩි 15කට සීමා කෙරිණි.) මෙම සම්මුඛ සාකච්ඡා ශ්‍රව්‍ය මාධ්‍යයෙන් පටිගත කරන ලද අතර එම වචනයෙන් ම වාර්තාගත කෙරිණි. පහත සඳහන් ප්‍රශ්න විදුහල්පතිවරුන්ගෙන් විමසන ලදී.

1. පාසලෙහි ගුරු පුස්තකාලයාධිපතීන්ගේ භූමිකාව ඔබට පැහැදිලි කළ හැකි ද?

2. පාසල් පුස්තකාලයේ භූමිකාව කුමක් ද?

3. ඔබ ගුරු පුස්තකාලයාධිපතිගේ භූමිකාවට බලපෑම් කර ඇත්තේ කෙසේ ද?

4. අනාගතයේ ගුරු පුස්තකාලයාධිපති භූමිකාවෙන් ඔබ දක්නට කැමති සංවර්ධනයන් මොනවාද?

5. විෂයමාලා ප්‍රධානියෙකුගේ සහ තොරතුරු සන්නිවේදන තාක්ෂණ සම්බන්ධීකාරකයෙකුගේ භූමිකාවට ගුරු පුස්තකාලයාධිපතිගේ භූමිකාව සම්බන්ධ වන්නේ කෙසේ ද?

6. විදුහල්පතිවරයෙකු ලෙස ඔබගේ භූමිකාවට ගුරු පුස්තකාලයාධිපති සහාය වන්නේ කෙසේ ද?

7. නව ගුරු පුස්තකාලයාධිපතිවරයෙකු බඳවා ගැනීමට ඔබට හැකියාව ඇත්නම් ඔබ අපේක්ෂා කරනුයේ කුමක් ද?

ගුණාත්මක, අර්ථකථනාත්මක එළඹුමකින් දත්ත විශ්ලේෂණය කරන ලදී. සමානතා සහ වෙනස්කම්වල රටාව අනාවරණය සඳහා තේමාත්මක විශ්ලේෂණය සිදු කෙරිණි. වාර්තාගත කරන ලද සම්මුඛ සාකච්ඡාවන්හි සඳහන් නියත භූමිකාවන්ගේ වාර ගණන ගුරු පුස්තකාලයාධිපතින්ගේ පදනම් අංගවල දර්ශකයක් ලෙස දැක ඇත. පූර්ව නිශ්චය කිරීමකට වඩා පොදු අංගවල පරාසයක් දත්තවලින් මතු කර ගැණිනි. ඒවා මෙසේය.

- සිසුන්ගුරු පුස්තකාලයාධිපතීන් සිසුන් වෙනුවෙන් ඉටු කරන්නේ යැයි විදුහල්පති සංජානනය කරනුයේ කුමක් ද?
- ගුරුවරුන්ගුරු පුස්තකාලයාධිපතීන් ගුරුවරුන් වෙනුවෙන් ඉටු කරන්නේ යැයි විදුහල්පති සංජානනය කරනුයේ කුමක් ද?
- නායකත්වය සහ කළමනාකරණය ගුරු පුස්තකාලයාධිපතීන්ගේ නායකත්ව සහ කළමනාකරණ භූමිකාව
- විදුහල්පතිගුරු පුස්තකාලයාධිපති විදුහල්පතිට සහාය වන ආකාරය
- ගුණාංග විදුහල්පති ගුරු පුස්තකාලයාධිපතිගෙන් අපේක්ෂා කරන ගුණාංග

මෙම පොදු අංග භාවිතයෙන් පුද්ගල පැතිකඩ ගොඩනංවන ලදී. පාසල් අතර මෙම භූමිකාවන් සැසඳීමටත් විභේදනය කිරීමටත් මෙයින් හැකියාව ලැබිණි. විදුහල්පති ස්වකීය අදාළ ගුරු පුස්තකාලයාධිපතිගේ භූමිකාව පැහැදිලි කරන ආකාරය විස්තර කරන විස්තරාත්මක අභිධානයක් මෙම පැතිකඩ මගින් සපයා ඇත.

උදා: විශේෂඥ ගුරුවරයා, සම්බන්ධීකාරකයා, විෂයමාලා නායකයා. පහත සඳහන් උපුටා ගැනීම් වෙන් කරන කේත ලෙස මෙම අභිධාන භාවිත කර ඇත. උප ග්‍රන්ථයෙහි දක්වා ඇති වගුවල පුද්ගල පැතිකඩ සාරාංශගත කර තිබේ.

තේමා ගණනාවක් දත්තවලින් හඳුනා ගන්නා ලදී. මේවා ගුරු පුස්තකාලයාධිපති විදුහල්පතිට සහ පාසලට සපයන ලද වටිනාකම වටා පදනම් වී ඇත.

1. මුදල සඳහා වටිනාකම පළමුව ගුරුවරයා, දෙවනුව පුස්තකාලයාධිපති

2. පුළුල් දැක්මක් සැපයීමේ දී වටිනාකම

3. උපදෙස් දීමේ දී සහ අදහස් සැපයීමේ දී වටිනාකම

4. තොරතුරු සන්නිවේදන තාක්ෂණයෙහි නායකත්වය සැපයීමේ දී වටිනාකම

5. ගුරු පුස්තකාලයාධිපතිගේ ගුණාංගයන්හි දී වටිනාකම

## ගුරු පුස්තකාලයාධිපතීන්ගේ භූමිකාව පිළිබඳ විදුහල්පතීන්ගේ සංජානනය

විදුහල්පතිවරුන් නව දෙනා ම ගුරු පුස්තකාලයාධිපතිගේ භූමිකාව දැක ඇත්තේ බෙහෙවින් වෙනස් ආකාරයටය. ඒ ඒ ගුරු පුස්තකාලයාධිපතීන්ගේ පෞරුෂය සහ ප්‍රවීණත්වය, පාසල තුළ පුස්තකාලයේ භූමිකාව, විෂයමාලා ප්‍රධානියා සහ තොරතුරු සන්නිවේදන සම්බන්ධීකාරකයා ඇතුළු පාසලේ අනෙකුත් කාර්යමණ්ඩලයේ නායකත්ව හා කළමනාකරණ භූමිකාවන් පැවතීම යන සාධකවල පරාසය මීට හේතු වී ඇත. සමහර පාසල්වල ගුරු පුස්තකාලයාධිපතීන් මෙම සෑම භූමිකාවක ම කොටස් ඉටු කළහ. එහෙත් අනෙක් පාසල්වල පුස්තකාල කළමනාකරුගේ භූමිකාවට ගුරු පුස්තකාලයාධිපති සීමා වී ඇත. ගුරු පුස්තකාලයාධිපති විශේෂඥ ගුරුවරයෙකු, සම්පත්වල කළමනාකරුවෙකු, මනා සහයෝගය දක්වන්නෙකු විය යුතු බව භූමිකාව පිළිබඳ විදුහල්පතිවරුන්ගේ සංජානනයේ පොදු අංග විය. තේමාවන් පිළිබඳ පහත දැක්වෙන විස්තරයේ දී මෙම සමානතා සහ අසමානතා පැහැදිලි කර ඇත. උපග්‍රන්ථයේ දී තේමාවන් සවිස්තරාත්මකව ඉදිරිපත් කෙරේ.

තේමාව 1 : මුදල් සඳහා වටිනාකම : පළමුව ගුරුවරයා, දෙවනුව පුස්තකාලයාධිපති

ගුරු පුස්තකාලයාධිපති පළමුව ගුරුවරයෙකු සහ දෙවනුව පුස්තකාලයාධිපති වන බව විදුහල්පතිවරු බොහොමයක් ප්‍රබලව පවසා සිටියහ. (මෙම සන්දර්භය තුළ ඉගැන්වීම යනු පංතියේ කණ්ඩායමකට අත්‍යවශ්‍යයෙන් ම පවරා ඇති කාර්යයකට වඩා පුස්තකාලය තුළ පංති සමඟ විධිමත් ලෙස වැඩ කටයුතු කිරීමක් ලෙස දකින ලද බව මෙහි දී සඳහන් කළ යුතුය.) ගුරු පුස්තකාලයාධිපති පළපුරුදු, විශේෂඥ ගුරුවරයෙකු විය යුතු බව ඔවුහු පැහැදිලි කළහ.

''මං හිතනවා අවධාරණය යොමු වෙලා තියෙන්නෙ 'ගුරුවරයා' කියන වචනෙටයි කියලා. මං හිතනවා ගුරු පුස්තකාලයාධිපති මුලින් ගුරුවරයෙකු වෙලා දෙවනුව පුස්තකාලයාධිපති වෙන්න ඕනෙ කියලා........ මං හිතනවා ගුරු පුස්තකාලයාධිපතීන් තමන්ගෙ කාලයෙන් වැඩි හරියක් පංතියත් එක්ක කටයුතු කරන්න ඕනෙ කියලා. සාමාන්‍යයක් හැටියට ගත්තොත් කාලයෙන් 60% - 70% ක් විතර. ගුරු පුස්තකාලයාධිපතිවරු මේ දේ නොකරන හින්දයි ඒ අයට ගුරුවරු හැටියට නොසැලකෙන්නෙ. ඒ

හින්දා තමයි පාසල් ප්‍රජාව ඒ තරම් හිතන්නෙ නැත්තෙ මේ වැඩේ එහෙමකට වටිනාකමක් තියෙනව කියලා. මං හිතන්නෙ ඒක තමයි තීරණාත්මක අධ්‍යාපනික කාර්ය.'' (ගුරුවරයා)

''මං දකින විදිහට හොඳ ගුරු පුස්තකාලයාධිපති කෙනෙක් හොඳ ගුරුවරයෙක් වෙන්න ඕනෙ.'' (සුපිරි පුද්ගලයා)

''අපේ හොඳම සම්පත ගුරු පුස්තකාලයාධිපති කියල මෙහෙ ඉන්න ගුරුවරු ඔබට කියාවි....... එයා හුඟක් වෙලාවට තමන්ව දකින්නෙ ගුරුවරයෙක් විදිහටයි, හැම පංති කාමරයකට ම සම්බන්ධ ගුරුවරයෙක් විදිහටයි.'' (විෂයමාලා නායකයා)

''ඒ අය මුලින් ම ඉහළ ගුණාත්මක බවක් තියෙන ගුරුවරයෙක් හැටියට තමන්ව දකින්න ඕනෙ. ඒ අය ගුණාත්මක බවින් ඉහළ ගුරුවරයෙක් හැටියට එනවා නම්, මට ඕනෙ නම් මට පුළුවන් වෙනත් දේවල්වලටත් එයාලව පුහුණු කරන්න. ඒත් උගන්නන්න දක්ෂ, පුහුණුව ලබපු පුස්තකාලයාධිපති කෙනෙක් හොයාගන්න එක ලේසි නෑ.'' (විශේෂඥ ගුරුවරයා)

ඉගැන්වීම සඳහා ගුරු පුස්තකාලයාධිපතීන්ව යොදා ගැනීමේ දී ආයෝජනය කිරීමට අරමුදල් තමන්ට අවශ්‍ය බව විදුහල්පතිවරු පැවසූහ. පුස්තකාලයක කටයුතු පවත්වා ගෙන යාමට තමන්ට පුස්තකාල සහායකයෙකු කුලියට ගත හැකි බව ඔවුහු පෙන්වා දුන්හ.

'' පුස්තකාලයක් කළමනාකරණය කරන කෙනෙකුට වඩා, පුස්තකාලයාධිපති කෙනෙකුට වඩා එයාගෙ භූමිකාව පළල් විදිහට දකින්නයි මට ඕනෙ. මොකද වැඩි කාර්යයන් ගුරුවරයා මතත් පොඩි කාර්යයන් පුස්තකාලයාධිපති මතත් පැටවෙන හින්දා. ඒ නිසා මට පුළුවන් පුහුණුව ලබපු, හොඳ ගුණාත්මක ගුරු සහායකයෙකු ලවා පුස්තකාල සේවා සැහෙන දුරකට සපයන්න. ඒත් මට කරන්න බැරි දේවල් ටිකක් තියෙනවා. ඒ හින්දා මට ඕනෙ වෙනවා සම්පතක් පාවිච්චි කරන්නෙ කොහොම ද කියලා දකින්න පුළුවන් ගුරුවරයෙකුගෙ ඇහැක් තියෙන කෙනෙක්.'' (විශේෂඥ ගුරුවරයා)

එක් විදුහල්පතිවරයෙකු දැනටමත් තම ගුරු පුස්තකාලයාධිපතිගේ ස්ථානයට අඩු ගෙවීමක් සහිත පුස්තකාල සහායකයෙකු පත් කර තිබිණි. මන්ද, ගුරු පුස්තකාලයාධිපතිගේ ගුරු කොටස ඔහු ලබා ගනිමින් සිටි බව ඔහුට දැනීමක් නොවූ බැවිනි.

''ඔබ ගුරු පුස්තකාලයාධිපතිගෙ 'ගුරු' කොටසට ගෙවන එකත් ගුරු පුස්තකාලයාධිපතිගෙන් ඔබ කිසිම 'ගුරු' කාර්යයක් නොගන්න එකත් තමයි මගෙ ලොකු ම චෝදනාව. මට තියෙන ගැටලුව ඒකයි. එතකොට මගෙ අමාරුකම වෙන්නෙ ගුරු පුස්තකාලයාධිපති අනිත් ගුරුවරුන්ට සමාන කොන්දේසි යටතේ සේවයේ යෙදුණත් ඒකට අහලකින්වත් සම්බන්ධ වෙන මුහුණට මුහුණ වැඩක් නොකරන එක. ඒ වගේ ම ඔබ රළු යෙදුමක් පාවිච්චි කරන්න කැමති නම්, අපි ගුරුවරයෙකුට ගෙවන්නෙ එයා ළමයි 25ක් ඉස්සරහ හිටගෙන දවසට පැය හතක් කරන වැඩේට........... ඔබ ගුරු පුස්තකාලයාධිපතිට ඩොලර් 90000ක් ගෙවනවා. මං හිතන්නෙ නෑ මට ඩොලර් 90000ක වටිනාකමක් ලැබෙනවා කියලා. මගෙ අත්දැකීමට අනුව නම් එහෙම වෙන්නෙ කලාතුරකින්.''

ගුරු පුස්තකාලයාධිපති ඉටු කරන කාර්යය සහ (ජාතික තක්සේරු වැඩසටහන සාක්ෂරතාව සහ ගණිත හැකියාව (NAPLAN) නම්) ඔස්ට්‍රේලියාවේ ප්‍රමිත පරීක්ෂණ ක්‍රමය සඳහා ලකුණු ඉහළ නැංවීම අතර සබඳතාව සමහර විදුහල්පතිවරුන් පැහැදිලිව ම දක නොමැත. නිදසුනක් ලෙස, විශේෂඥ ගුරුවරයෙකුගේ විදුහල්පති පැහැදිලි කරන ලද්දේ NAPLAN ලකුණු ඉහළ නැංවීම මත පදනම්ව කාර්යමණ්ඩල යෙදවීමට තමාට අවශ්‍ය වුවත් මෙම ලකුණු සංවර්ධනය වෙත ගුරු පුස්තකාලයාධිපති බලපෑමක් කර තිබුණි ද යන්න ඔහුට නිසැක නොවූ බවය.

''මගෙ ළඟ තියෙන සේරම සම්පත් දිහා බලනකොට ගුරු පුස්තකාලයාධිපති පේන්නෙ සම්පත්වලින් ඩොලර් 90000 ක මිලක් තියෙන පූර්ණකාලීන ගුරුවරයෙකුට සමාන කෙනෙක් හැටියටයි. ඩොලර් 90000 ක සම්පත් ගැන ඕනෑම විචාරාත්මක බවක් මට තියෙනව නම්, මගේ කියවීමේ, ලිවීමේ වගේ ම අක්ෂර වින්‍යාසයේ NAPLAN ලකුණු වැඩි කර ගන්න එකට මගෙ සම්පූර්ණ අවධානය යොමු වෙලා තියෙනව නම්, මගෙ ප්‍රතිඵලය NAPLAN ලකුණුවලිනුයි තවත් ඒ වගේ දේවල්වලිනුයි මනින්න යනවා නම්, මගෙ අංක එකේ තේරීම වෙන්නෙ ඩොලර් 90000 ක් ගෙවලා ගුරු පුසත්කාලයාධිපති කෙනෙක් පත් කර ගන්න එක ද? නිශ්චිතව ම ක්වින්ස්ලන්තෙ විදුහල්පතිවරුන්ට මුහුණ දෙන්න වෙලා තියෙන දේ මේකයි. මට මේක කාට හරි යොමු කරලා එහෙම කියන්න පුළුවන්. මට ඩොලර් 90000 ක් ලැබිලා තියෙනවා. ඔබ ඔබේ NAPLAN ලකුණු වැඩි කර ගන්න මුළුමනින් ම බැඳිලා ඉන්නවා.ඔබට මොනව ද ඒකෙන් මිල දී ගන්න ඕනෙ? කී දෙනෙක් මෙහෙම කියයි ද කියලා මට විශ්වාස නෑ. හොඳයි මං හිතන්නෙ මට ගුරු පුස්තකාලයාධිපති කෙනෙක් ඕනෙ. ඒක තමයි මගෙ අංක එකේ ප්‍රමුඛතාවය; ඒ අය හුඟක් වෙලාවට මෙහෙම කියන්න ඉඩ තියෙනවා; මට අවුරුද්දකට ගුරු සහායකයෙකුගෙ කාලයෙන් පැය 3600 ක් ඕනෙ; මට ඩොලර් 90000 ක් වටින කියවීම් ද්‍රව්‍ය ඕනෙ. එහෙම නැත්නම්, මට සාක්ෂරතා පුහුණුකරුවෙක් ඕනෙ. එහෙමත් නැත්නම්, මට සුසධ්‍යකාරකයෙක්, ගුරු සුසධ්‍යකාරකයෙක්, ඉගැන්වීම් ක්‍රමවලට මග පෙන්වන්නෙක් ඕනෙ; එහෙම නැත්නම් ඒ වගේ තවත් කෙනෙක්. මගෙ අපේක්ෂා ලැයිස්තුවට ඇතුළත් වෙන්නෙ බොහෝදුරට ඒ වගේ කෙනෙක්. මෙහෙ ඉතාම හොඳ ගුරු පුස්තකාලයාධිපති කෙනෙක් ඉන්න එක මගෙ වාසනාවක්. එහෙම කිව්වට, මගෙ NAPLAN වැඩි කර ගන්න පැත්තට යොමු වෙන්න මේ ඩොලර් 90000 සමත් වෙයි කියල මං තවමත් හිතන්නෙ නෑ. ඒක තමයි උභතෝකෝටිකය. (විශේෂඥ ගුරුවරයා)

## තේමාව 2 : පුළුල් දැක්මක් සැපයීමේ දී වටිනාකම

ගුරු පුස්තකාලයාධිපතීන් ස්වකීය භූමිකාවට සහ සමස්ත පාසලට ගෙන ආ වටිනාකම වූයේ ඔවුන්ගේ පුළුල් දැක්ම බව විදුහල්පතිවරු සඳහන් කළහ. කාර්යමණ්ඩලයේ සහ සිසුන්ගේ අර්ථයෙන් පාසලේ සිදුවෙමින් පැවති දෙය සහ විෂයමාලාව හා ඉගැන්වීම් ක්‍රම විද්‍යාව සම්බන්ධයෙන් සමස්ත පාසල් දැක්මක් පිළිබඳ පුළුල් චිත්‍රයක් අවබෝධ කර ගැනීම මීට ඇතුළත් වේ. 'පොළොවට සවන් තබාගෙන' සිටිය යුතු ගුරු පුස්තකාලයාධිපති මත රඳා පැවති සුපිරි පුද්ගලයාගේ විදුහල්පති විසින් ඉදිරිපත් කළ අදහස්වලින් එය නිදර්ශනය වේ.

''පාසලේ දී ඒ අයගේ දැක්මත් පාසලේ දී ඒ අයගේ තත්ත්වයත් හින්දා ඒ අයට බොහොම පුළුල් දැක්මක් තියෙනවා. සිද්ධ වෙමින් තියෙන දේට සැලකිය යුතු තරම් හොඳ නොපෙනීමකුයි පෙනීමකුයි ඒ අයට තියෙනවා. මං පළල් සංවාද වෙනුවෙන් බොහොම බරපතළ විදිහට ගුරු පුස්තකාලයාධිපති මත රඳා පවතිනවා. ගුරු පුස්තකාලයාධිපති ලබා දෙයි කියලා ඔබ හිතන දෙයින් එහාට ගිය වැදගත් තොරතුරු මට ඒ සංවාදවලින් ලබා ගන්න පුළුවන්.''

'මං ආයෙත් උත්සාහ කරනවා ගුරු පුස්තකාලයාධිපති පුළුල් අයවැය සාකච්ඡාවලට ඇතුළත් කරන්න. ඒ අය හුඟ දෙනෙකුට කතා කරන හින්දා, පොදුවෙ පාසලේ ප්‍රමුඛතා සකසන්න ඒ සාකච්ඡා අපිට උපකාරී වෙනවා. මගෙත් එක්ක සාකච්ඡා කරමින් හිටියත් සාකච්ඡාව වෙනස් වෙන්න පුළුවන් කියන පදනම මත ඒ අය වැඩි පිරිසකට කතා කරනවා. මොකද, මිනිස්සු ගුරු පුසත්තකාලයාධිපති තමන්ගෙ වෘත්තීය සගයෙක් කියලා දකින හින්දා ඒ අය පාසලේ ප්‍රධානියත් එක්ක කතා කරනවට වඩා වෙනස් විදිහකටයි ගුරු පුස්තකාලයාධිපතිත් එක්ක කතා කරන්නෙ. ගුරු පුස්තකාලයාධිපතිවරු හැම වසර මට්ටමක් එක්කම වැඩ කටයුතු කරන හින්දා ප්‍රාථමික අවුරුදුවල ගුරුවරු වද වෙන්නෙ මොනවට ද කියලා ඒ අයට ඇහෙනවා. හය වෙනි වසරට මොනව ද කරන්න ඕනෙ කියලා ඒ අය අහනවා. ඉතිං ගුරු පුස්තකාලයාධිපතිගෙ දොරට තට්ටු කළහම මෙහෙම කියනවා. ''බලන්න මං පහේ පංතියෙ අයත් එක්ක කතා බහක් කර කර හිටියා, ඒ අය මේ ගැන කතා කරමින් හිටියෙ. ඒවා තුනේ පංතියෙ අය කරමින් හිටිය වැඩවලට ළඟින් ම සම්බන්ධයි. අන්තිමට ඒක කරගෙන යන්න පහසුකම් අපිට නෑ. ඒක අපිට අයවැයට දාන්න පුළුවන් දෙයක් නේද?' ඒ හින්දා මං හිතනවා මං ඒ අය මත බරපතළ විදිහට රඳා පවතිනවා කියලා. ඒ අය සාමාන්‍යයෙන් පොළොවට කන් තියාගෙන ඉන්නෙ. ඒකෙන් ඒගොල්ලො පාසලේ හැඟීම් හඳුන ගන්නවා. ඒ විදිහට ඒ අයට පුළුවන් වෙනවා කාර්යමණ්ඩලයෙ, දෙමව්පියන්ගේ, සිසුන්ගේ හැඟීම් හඳුන ගන්න. ඔබට ගුරු පුස්තකාලයාධිපතීන්ගෙන් හොඳ උපදෙස් ගොන්නක් ලැබෙනවා.'' (සුපිරි මිනිසා)

පාසලේ සියලු කාර්යමණ්ඩලය සහ සිසුන් සමඟ ගුරු පුස්තකාලයාධිපති අන්තර්ක්‍රියාකාරී වූ හෙයින් ඔවුනට පාසල පුරා ඇති එකට බැඳීම හෝ එහි අඩුව දැක ගත හැකි බව තවත් විදුහල්පතිවරයෙකු පැහැදිලි කළේය. එමෙන් ම සහාය සහ/ හෝ මැදිහත් වීම අවශ්‍ය කාර්යමණ්ඩල සාමාජිකයන් හෝ සිසුන් හඳුනා ගැනීමට ඔවුනට හැකියාව ඇත. මෙලෙස ඔවුහු ගල් අඟුරු ආකරයේ ආලෝකය වෙති.

''කාර්යමණ්ඩලයේ හද ගැහෙන තැන හරියටම දැන ගන්න එයාලට පුළුවන්. එයා කාර්යමණ්ඩලයෙ හුඟ දෙනෙක් එක්ක අන්තර්ක්‍රියා කරන හින්දා එයා ඔබට මිනිසුන් ඉන්න තැන ගැන නියම වගේ ම හුඟක් දුරට නිවැරදි දැක්මක් ලබා දෙනවා. මං ගුරු පුස්තකාලයාධිපති මත බොහොම බරපතළ විදිහට රඳා පවතින්නෙ ඒ අර්ථයෙන්. මං මේක ගන්නෙ රූපකයක් විදිහට, කහ පාට එළිය? ආකරයේ කහ පාට එළි? (සම්බන්ධක)

''සම්පත් ගැන වගේ ම හුඟක් දුරට තමන් තුළ වෙනස් ධාරිතාවක් දකින සිසුන් ගැන ලොකු චිත්‍රයක් තියෙන ගුරු පුස්තකාලයාධිපති කෙනෙක් මට ඉන්නවා. යම් විදිහක මැදිහත් වීමක් ඕනෙ කරන ශිෂ්‍ය කණ්ඩායම් වගේ ම ශිෂ්‍යයො ගැන මාව අවදියෙන් තියන එකත් ඒකෙම කොටසක්.

සම්පත් ගැනත් එක කණ්ඩායමකට ඕනෙ කරන දේ ගැනත් ඒ නිශ්චිත සම්පතෙන් අනෙක් කණ්ඩායමට ලබන්න පුළුවන් ප්‍රතිලාභ ගැනත් ලොකු චිත්‍රයක් හැම තිස්සෙම වගේ තියෙන්න ඕනෙ. ගැටලුවල සමස්ත පරාසය ගැන පරිපාලනය දැනුවත්ව තියන එක හරි ම වැදගත්.'' (කළමනාකරුවා)

## තේමාව 3 : උපදෙස් දීමේ දී සහ අදහස් සැපයීමේ දී වටිනාකම

(පුළුල් දැක්මක් සහිත ගුරු පුස්තකාලයාධිපතිවරයෙකු විසින්) ක්ෂේත්‍රය පුරා සිදු වෙමින් පැවති දේ පිළිබඳ අදහස් හා දැනුම ඇතුළු කරුණු පරාසයක් සම්බන්ධයෙන් විදුහල්පතිවරුන්ට උපදෙස් සැපයීය. මෙයට විෂයමාලාව සහ ඉගැන්වීම ක්‍රම විද්‍යාව (විෂයමාලා නායකයා, විශේෂඥ ගුරුවරයා, අභියෝග සපයන්නා හා), සම්පත් (කළමනාකරු, ඩිජිටල් තොරතුරු නායකයා), කාර්යමණ්ඩලය හා සිසුන් (සම්බන්ධක, කළමනාකරු, සුපිරි පුද්ගලයා) සහ ඉගෙනුම් අවකාශ සැලසුම් කිරීම (සුපිරි පුද්ගලයා, ඩිජිටල් තොරතුරු නායකයා) ඇතුළත් වේ.

''මං ඇයගෙ අදහස්වලට ඇහුම්කන් දෙන්න කැමතියි. එයා මෙහෙම කියන්න පුළුවන්. 'මං මේ දේ කියෙව්වා එයා සමහර විට මගෙ බන්දේසියට පොත් විසි කරනවා.' එහෙම නැතිනම් එයා මෙහෙම කියාවි. 'මං සති අන්තෙ දි පුස්තකාලෙ මේ විශිෂ්ට දේ දැක්කා.' එයා හුඟක් සතුටින් මෙහෙම කියාගෙන එනවා 'අහා, ඔයාට ඇහුණ ද? ඔයා ඒ ගැන හිතනව ද? ඒකත් එක්ක අපි යන්න ඕනෙ එතනටයි.' ඒ හින්දා මං අනුමාන කරනවා පාසලේ සම්පත් ගැන මගේ සිතිවිලිවලට ඇය බලපානවා කියලා. (ඩිජිටල් තොරතුරු නායකයා)"

"පළල් කතාබහක් වෙනුවෙන් මං හුඟක් දුරට බරපතළ විදිහට ගුරු පුස්තකාලයාධිපති මත රඳා පවතිනවා. ඒකෙන් මට පුළුවන් ගුරු පුස්තකාලයාධිපති උපදෙස් දෙයි කියලා ඔබ හිතන දෙයට වැඩිය ගොඩක් ඉදිරියෙන් තියෙන වැදගත් තොරතුරු උකහා ගන්න. (සුපිරි පුද්ගලයා)"

"යමක් හොඳට ම උගන්නන්නෙ කොහොම ද කියලා දැක්මක් එයාට නිශ්චිතව ම තියෙනවා. මට උපදෙස් දෙන්න දැනුවත් බවක් ඇති කර ගන්න ඒක එයාට උදව් වෙනවා..... මං අවධානයක් යොමු කරපු නැති දේ එයා ඉදිරිපත් කරනවා. ඒවා ක්‍රියාවට නංවනවා. (විශේෂඥ ගුරුවරයා)"

## තේමාව 4 : තොරතුරු සන්නිවේදන තාක්ෂණයේ දී නායකත්වය සැපයීමේ වටිනාකම

පොත්වලින් ඔබ්බට ගමන් කළ සහ ඉගැන්වීම හා ඉගෙනුම සඳහා තොරතුරු සන්නිවේදන තාක්ෂණයේ ප්‍රවීණත්වයක් තිබූ අයෙකු ලෙස බොහෝ විදුහල්පතිවරු තමන්ගේ ගුරු පුස්තකාලයාධිපතීන් අගය කළහ. (සුපිරි පුද්ගලයා, විශේෂඥ ගුරුවරයා, අභියෝග කරන්නා, සම්බන්ධක, ඩිජිටල් තොරතුරු නායකයා, කළමනාකරුවා) ගුරු පුස්තකාලයාධිපති කාර්යමණ්ඩලය සඳහා වෘත්තීය සංවර්ධනය සහ පුහුණුව සැපයීම (උදා: නව ඉගෙනුම් කළමනාකරණ පද්ධතියක් ක්‍රියාත්මක කිරීම) (අභියෝග කරන්නා), පුස්තකාලයේ තිබෙන ඩිජිටල් තාක්ෂණයන් භාවිතය (කළමනාකරු), තොරතුරු සන්නිවේදන තාක්ෂණය ඉගෙනුම තුළට කාවැද්දීම සහ කාර්යමණ්ඩලය සඳහා පද්ධති ව්‍යාප්ත තොරතුරු සන්නිවේදන තාක්ෂණ පුහුණුවක් සංවිධානය කිරීම (විශේෂඥ

ගුරුවරයා) මෙයට ඇතුළත් වේ. ඇතැම් අවස්ථාවල දී (විශේෂඥ ගුරුවරයා, සුපිරි පුද්ගලයා) ගුරු පුස්තකාලයාධිපති, ගුරු පුස්තකාලයාධිපතිගේ සහ තොරතුරු සන්නිවේදන තාක්ෂණ සම්බන්ධීකාරකගේ ද්විත්ව භූමිකාව ඉටු කළේය.

''පාසලේ තොරතුරු තාක්ෂණ වැඩසටහනේ දී අපේ ගුරු පුස්තකාලයාධිපතිට තියෙනවා ලොකු භූමිකාවක් ඉටු කරන්න......... අපේ ගුරු පුස්තකාලයාධිපති හුඟක් වෙලාවට තොරතුරු තාක්ෂණ ගුරු සුසාධ්‍යකාරකයෙක්ගෙයි තොරතුරු තාක්ෂණ සම්බන්ධීකාරකයෙක්ගෙයි වගකීම් සම්පූර්ණ කරනවා............. සමස්ත තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයෙ නායකත්වය වැඩි වැඩියෙන් අර ගන්න ගුරු පුස්තකාලයාධිපතීන්ට තියෙන ඉල්ලුම ඉහළ යනවා කියලා මට හිතෙනවා. (සුපිරි පුද්ගලයා)

තොරතුරු සන්නිවේදන තාක්ෂණයන් සමග යාවත්කාලීන වන අයෙකු ලෙස ගුරු පුස්තකාලයාධිපති ඇගයීමට ලක් කෙරිණි.

''අනාගතයෙ සිද්ධ වෙන දේ ගැන ඇය දන්නවා. ඒ හින්දා එයාට පුළුවන් ඩිජිටල් ඉගැන්වීම් ක්‍රම, ඩිජිටල් තොරතුරු ගැන කණ්ඩායමේ අනිත් අයව දැනුවත් කරන්න. අයිපෑඩ් වගේ දේවල්. දරුවන්ට හුරුපුරුදු සේරම ඩිජිටල් තාක්ෂණයන් එක්ක දරුවන් ඉස්සරහට අරගෙන යන්න එයාට පුළුවන්. මූලිකව එයාගෙ කාර්යය වෙන්නෙ යාවත්කාලීන වෙන එකයි, දරුවන් තාක්ෂණය එක්ක ඉන්න තැනට වඩා ඉදිරියෙන් ඉන්න එකයි. (ඩිජිටල් තොරතුරු නායකයා)

## තේමාව 5 : ගුරු පුස්තකාලයාධිපතීන්ගේ ගුණාංගයන්හි වටිනාකම

විදුහල්පතිවරුන්ගේ ප්‍රතිචාරයන්හි පොදු රැහැනක් වූයේ තනි පුද්ගලයෙකු ලෙස ගුරු පුස්තකාලයාධිපති සහ භූමිකාවක් ලෙස ගුරු පුස්තකාලයාධිපති අතර සබඳතාවයි. ගුරු පුස්තකාලයාධිපති තනි පුද්ගලයෙකු ලෙස අගය කෙරිණි. එනම්, නෛසර්ගිකව භූමිකාව නොව භූමිකාවට වැදගත්කමක් දුන් පුද්ගලයාය. තමන් නව ගුරු පුස්තකාලයාධිපතිවරයෙකු බඳවා ගන්නේ නම්, මූලික වශයෙන් ඔවුන් අපේක්ෂා කරන ගුණාංග පැහැදිලි කළ විට, ඔවුහු සාමාන්‍යයෙන් දැනට සිටින ගුරු පුස්තකාලයාධිපතීන්ගේ ගුණාංගවලට සම්බන්ධව මෙකී ගුණාංග ලැයිස්තුගත කර පැහැදිලි කළහ. (කැපී පෙනෙන ව්‍යාතිරේඛය වූයේ ගුරුවරයකු නොවන විදුහල්පතිය) මෙම ගුණාංගවලට පුද්ගල ගුණාංග සහ නායකත්ව ගුණාංග ඇතුළත් වේ. පළපුරුදු සහ විශේෂඥ ගුරුවරයෙකු වීම මගින් ඒවා ශක්තිමත් කෙරේ.

''අපි හොයන්නෙ හොඳ, ඵලදායී ඉගැන්වීමක් විදහා පෙන්වන අය. ඒ අය සාහිත්‍යයට කැමැත්තක් දක්වනවා. ඉගෙනීමට තාක්ෂණය තීරණාත්මක බව ඒ අය දකිනවා.ගුරුවරුන් එක්ක, ගුරුවරුන් සඳහා නොවෙන, එහෙම නැත්නම් ගුරුවරුන්ට ඉහළින්, නැතිනම් ඔවුන් වටා වැඩ කරන කෙනෙක් හැටියට ඒ අය තමන්ගෙ භූමිකාව දකිනවා. මං හිතනවා ඒක තීරණාත්මක දෙයක් කියලා. ඉගැන්වීම් ක්‍රම විද්‍යාව ගැන කතා බහට දායක වෙන්න වගේ ම මිනිස්සු විශ්වාසවන්ත බවයි ප්‍රයෝජනවත් බවයි හොයන විදිහට දායක වෙන්න ඒ අයට පුළුවන්. ඒ හින්දා ඒ අය අපිට අභියෝග

කරන්න ඕනෙ. ඒ අය ඒක කරනවා. ඒ අය අභියෝග කරලා, නායකත්වය දීලා, ඒ වෙනුවෙන් පෙනී සිටිනවා.'' (සම්බන්ධක)

සාහිත්‍ය පිළිබඳ ඇල්ම වැදගත් වුවත් ගුරු පුස්තකාලයාධිපති සාම්ප්‍රදායික භූමිකාව ඉක්මවා ගොස් ඇති බව ඇතැම් විදුහල්පතිවරු පැහැදිලි කළහ.

''මං ඔබගෙ සම්මත වැඩ කොටසවත් ගුරු පුස්තකාලයාධිපති කෙනෙක් කරන දේවත් ගැන ප්‍රචාරයෙ යෙදෙන්නෙ නෑ. මං හිතන්නෙ මේ දවස්වල ගුරු පුස්තකාලයාධිපති කෙනෙක් කරන දේ ගැන වැරදි හැඟීම් සපයනවා. මං ප්‍රචාරයෙ යෙදෙන්නෙ කණ්ඩායමක් ඇතුළෙ වැඩ කරන්න පුළුවන් විෂයමාලාව දියුණු කරන අතිරේක ක්‍රියාකාරකම් කරන්න පුළුවන් විෂයමාලා නායකයෙක් වෙනුවෙනුයි.'' (විෂයමාලා නායකයා)

ඔවුන් අපේක්ෂා කරමින් සිටි ගුණාංග පරාසය ලැයිස්තුගත කිරීමේ දී තමන් එක් පුද්ගලයෙකුගෙන් බොහෝ දේ අපේක්ෂා කරමින් සිටි බව ඇතැම් විදුහල්පතිවරු පිළිගත්හ. නිදසුනක් ලෙස, ඔවුහු පුළුල් පරාසයක ගුණාංග ලැයිස්තුගත කර මෙසේ පැවසූහ. ''මං හඳුන්වලා දීල තියෙන්නෙ අමාරු පුද්ගලයෙක්!'' පුද්ගල හා නායකත්ව ගුණාංගවල පරාසයක් මෙම විස්තරයෙන් දෘශ්‍යමාන වේ.

''මට ඕනෙ ඇත්තට ම බාධක බිඳලා දාලා මිනිස්සු එකතු කරන තාක්ෂණික අවකාශයක් විදිහට පුස්තකාලය දකින, ඒ වෙනුවෙන් කතා කරන කෙනෙක්. අලුත් අදහස්වලට වගේ ම සිතීමේ අලුත් විධිවලට විවෘත කෙනෙක්. ස්වාභාවිකව ම කුතුහලය තියෙන කෙනෙක්. පර්යේෂණ කරන්න, කියවන්න, ඉගෙන ගන්න ඕනෙකමක් තියෙන පර්යේෂකයෙක්. අනිත් අයගෙන් ඉගෙන ගන්න බයක් නැති පුහුණුකරුවෙක් වගේ ම සුසාධ්‍යකාරකයෙක්. බලපෑම් සහගත සන්නිවේදනයක් කරන්න පුළුවන් කෙනෙක්. පිටතට ගිහින් මිනිස්සු වේදිකාවට අරගෙන එන්න පුළුවන්කම තියෙන දේශපාලනිකව සුහුරු කෙනෙක්.'' (ඩිජිටල් තොරතුරු නායකයා)

ලැයිස්තුගත කළ පුද්ගල ගුණාංග විවිධ මෙන් ම බහුල විය. සහයෝගිතාව, පොදු වගකීම සහ 'ජනතා පුද්ගලයෙක් ' වීම වැනි අන්තර්පුද්ගල කුසලතා ඒවාට අතුළත් විය. හාස්‍ය, නම්‍යශීලී වීම, සංවිධිත වීම, කුතුහලය සහිත වීම, අනුගත විය හැකි වීම මෙන් ම ඉගෙනීමට සහ ඉහළින් සහ අබිබවා යාමට ඇති කැමැත්ත පිළිබඳ හැඟීම ස්වාභාවික නැඹුරුතාවලට අයත් විය.

"ඉගැන්වීම් ක්‍රම විද්‍යාව මිනිසුන්ට සම්බන්ධ කරන ජනතාවගේ පුද්ගලයෙක්. (සම්බන්ධක) ඒ අයට අන්තර්පුද්ගල කුසලතාවල ඉහළ මට්ටමක් තියෙන්න ඕනෙ වගේ ම වෙනස් පුද්ගලයන්ගේ අවශ්‍යතාවලට වගේ ම ශෛලීන්වලට හැඩ ගැහෙන්න පුළුවන් වෙන්න ඕනෙ.'' (විශේෂඥ ගුරුවරයා)

දැක්ම, බලපෑම් කිරීම, අභියෝග කිරීම, පූර්ව ක්‍රියාකාරී වීම, පක්ෂව කතා කිරීම, දේශපාලනිකව සුහුරු වීම, සීමාවන් තල්ලු කිරීම, 'යෝජකයෙක් සහ සලිත කරන්නෙක් වීම', ශක්තිමත් කළමනාකරණ කුසලතා සහ මෙහෙය වීමට සූදානම් වීම නායකත්ව ගුණාංගවලට ඇතුළත් විය.

''නූතන (සම්පත්) මධ්‍යස්ථානයක් ක්‍රියාත්මක කරන්න ඕනෙ කරන හොඳ නායකත්ව වගේම බලපෑම් කිරීමේ කුසලතා එක්කත් කරන්න පුළුවන් දේ ගැන සීමා ඉස්සරහට තල්ලු කිරීම එක්කත් ශක්තිමත් කළමනාකරණ කුසලතා දෙගුණ වෙනවා. ඒක තනතුරු විස්තරයක් විදිහට ලියන්න ඔබට පුළුවන් ද දන්නෙ නෑ!'' (කළමනාකරු)

''මුලින් ම එයාලා හොඳ ගුරුවරු වෙන්න ඕනෙ. දෙවනුව හොඳින් සංවිධානය වෙන්න ඕනෙ. තෙවනුව ඒ අය නායකත්වය සපයන්න ලෑස්ති වෙන්න ඕනෙ.'' (විශේෂඥ ගුරුවරයා)

## විදුහල්පතිගේ සහාය සහ බලපෑම

එක් සම්මුඛ සාකච්ඡා ප්‍රශ්නයක් මගින් ගුරු පුස්තකාලයාධිපතිගේ භූමිකාවට විදුහල්පතිවරයා සහාය වූ සහ බලපෑ ආකාරයන් ගවේෂණය කෙරිණි. පුස්තකාලයට නිතර යාම, ගුරු පුස්තකාලයාධිපතිගෙන් උපදෙස් ගැනීමට අනෙක් කාර්යමණ්ඩලය දිරිමත් කිරීම, ප්‍රසිද්ධයේ පුස්තකාලය ප්‍රවර්ධනය කිරීම, ප්‍රමාණවත් ප්‍රතිපාදන සැපයීම, ප්‍රතිචාරාත්මක වීම සහ ගුරු පුස්තකාලයාධිපතිගේ අදහස් හා යෝජනා පිළිබඳ දිරිය සැපයීම, ඒ ඒ වර්ෂවල කණ්ඩායම් සමඟ විෂයමාලා සැලසුම් කිරීමට ගුරු පුස්තකාලයාධිපතිට ආරාධනා කිරීම එම ප්‍රශ්නයට ලැබුණු ප්‍රතිචාරවලට ඇතුළත් විය.

ඒ ඒ ගුරු පුස්තකාලයාධිපතිගේ විශේෂඥතාව ස්වකීය විදුහල්පතිවරුන් විසින් සපයන ලද සහායේ සහ බලපෑමේ මට්ටම වෙත තීරණාත්මක වූ බව දිස් විය. අධ්‍යයනයට සහභාගී වූ විදුහල්පතිවරුන් කීප දෙනෙක් කලින් සිටි වෘත්තීය සගයන් සමඟ වර්තමාන ගුරු පුස්තකාලයාධිපති සතුටුදායක ලෙස සැසඳූහ. ඒ අතරින් ඉහළ කාර්යසාධනයක් සහිත ගුරු පුස්තකාලයාධිපති කෙනෙක් 'වාසනාවන්ත' යනුවෙන් හැඳින්වීය. සිද්ධි කීපයක දී ඉහළ පූර්ව ක්‍රියාකාරී තත්ත්වය හේතුවෙන් ගුරු පුස්තකාලයාධිපති ප්‍රශංසාවට ලක් විය. සැබවින් ම, පාසලේ දී ගුරු පුස්තකාලයාධිපතිගේ භූමිකාව ඔවුනට බලපා තිබුණු ආකාරය විමසූ විට සම්බන්ධකගේ විදුහල්පති ප්‍රතිචාර දැක්වූයේ ''මං හිතනවා ඒ අය ලොකු බලපෑමක් කරනවා කියලා'' යනුවෙනි. ගුරු පුස්තකාලයාධිපතීන්ගේ විශේෂඥතාවේ දී විශ්වාසය පොදු පිළිතුරක් විය.

''මං උත්සාහ කරන්නෙ එයාට බාධා කරන්නෙ නැතුව එයාට උදව් කරන්න.''
(ඩිජිටල් තොරතුරු නායකයා)

''එයාගෙ වැඩේ කරගෙන යන්න ඉඩ දෙන්න විශ්වාසය තියෙනවා.'' (සුපිරි පුද්ගලයා)

## සාකච්ඡාව

මෙම අධ්‍යයනයෙහි සොයා ගැනීම් වෘත්තියේ වර්තමාන තත්ත්වය පිළිබඳ ඔස්ට්‍රේලියානු සෙනෙට් විමසුමෙහි (Commonweath of Australia, 2011) සොයා ගැනීම් යළි බල ගන්වන අංග ගණනාවක් අනාවරණය කරයි. පාසලේ ස්වභාවය සහ ගුරු පුස්තකාලයාධිපතීන්ගේ පුද්ගල කුසලතා හේතු කොට ගෙන සෑම පාසලක ම ගුරු පුස්තකාලයාධිපතීන්ගේ භූමිකාව බෙහෙවින් විකේන්ද්‍රික විය.

භූමිකාවේ සන්දර්භගත ස්වභාවය වෘත්තියේ එක් ගැටලුවක් පෙන්වා දෙයි. එනම්, භූමිකාවේ නෛසර්ගික වටිනාකමට වඩා පුද්ගලයෙකු ලෙස ගුරු පුස්තකාලයාධිපතිගේ වැදගත්කම වැඩි වශයෙන් දිස් වීමය. අතීතයේ දී ගුරු පුස්තකාලයාධිපති කාර්යමණ්ඩලයේ බලය ලත් විශේෂඥ සාමාජිකයෙක් විය. කෙසේ වෙතත්, ක්වීන්ස්ලන්තයේ දී මෙම තනතුර කාර්මික සම්මාන සහ ව්‍යාපාරික ගිවිසුම්වලින් ඉවත් කිරීමේ ක්‍රියාවලියක් පවතින බව පැහැදිලිව සඳහන් කරයි. බලය ලත් තනතුරු ඉවත් කිරීම සහ 'ස්වාධීන රජයේ පාසල් ' ආකෘතිය තුළ පාසල් ස්වාධිපත්‍ය ක්‍රියාත්මක කිරීම (Queensland Department of Education and Training, 2014) මගින් අදහස් වන්නේ මෙම තනතුර අල්ප වූවක් බවයි. මෙම තත්ත්වය ඔස්ට්‍රේලියාවට ආවේණික වූවක් නොවේ. එක්සත් ජනපදයේ විස්කොන්සින් (Klais සහ Bugher, 2010) සහ ඉලිනොයිස් (Van Tuyle සහ Walkin; 2012) ප්‍රාන්ත වැනි වෙනත් කලාපවල ද මෙම තත්ත්වය දක්නට ලැබේ.

මෙම අධ්‍යයනයේ ප්‍රතිඵල විදුහල්පති විසින් සපයන ලද සහාය, ගුරු පුස්තකාලයාධිපතීන්ගේ භූමිකාවට බලපාන ආකාරය අවධාරණය කරයි. තොරතුරු සාක්ෂරතාවෙන් යුත් පාසලක් සම්බන්ධයෙන් විදුහල්පතිගේ නායකත්ව භූමිකාව පිළිබඳ Oberg සහ Henri (2005) විසින් කරන ලද අධ්‍යයනය ද මෙම සහාය ක්‍රියාකාරකම් පෙන්වා දිණි. Church (2009, 40 පි.) තර්ක කළ පරිදි ''පුස්තකාල වැඩසටහන සැදීමට හෝ කැඩීමට විදුහල්පතිට පුළුවන. මේ ආකාරයට ම Kaylan (2006, xi පි.) පාසල් පුස්තකාල මාධ්‍ය විශේෂඥයෙක් පිළිබඳ අදහස් ඉදිරිපත් කරයි.'' ඇයට හැම විට ම සිටීමට සිදුව ඇත්තේ මහා පාසල් පුස්තකාල මාධ්‍ය වැඩසටහනින් දුරස්ථ හද ගැස්මකිනි. මන්ද, ඇය එක් විදුහල්පතිවරයෙකු 'පුහුණු' කළ වහා ම ඔහු/ඇය ඉවත්ව යන අතර ඇයට තවත් විදුහල්පතිවරයෙකු 'පුහුණු' කිරීමට සිදු වන බැවිනි. විදුහල්පති සහ ගුරු පුස්තකාලයාධිපති අතර ශක්තිමත් සහයෝගිත්ව හවුල්කාරිත්වයක් පවතින හෙයින් විදුහල්පති වෙතින් ලැබෙනුයේ බොහෝ දුරට දැනුවත් සහායක් වේ. (Shannon, 2012)

ගුරු පුස්තකාලයාධිපතිගේ භූමිකාව විෂයමාලාවට සම්පත් සැපයීමේ සාම්ප්‍රදායික භූමිකාවේ සිට කියවීම් ප්‍රවර්ධනය සහ තොරතුරු සාක්ෂරතා සංවර්ධනය දක්වා ව්‍යාප්ත වී තිබේ. තොරතුරු සන්නිවේදන තාක්ෂණ කුසලතා සංවර්ධනය සහ තොරතුරු සන්නිවේදන කුසලතා ඉගැන්වීම් ක්‍රම විද්‍යාත්මක නායකත්වය වඩාත් ප්‍රමුඛ එකතු කිරීම විය. සමහර අවස්ථාවල දී ගුරු පුස්තකාලයාධිපති තොරතුරු සන්නිවේදන තාක්ෂණ සම්බන්ධීකාරක ලෙස ද්විත්ව භූමිකාවක් ඉටු කර ඇත. ගුරු පුස්තකාලයාධිපති සහ තොරතුරු සන්නිවේදන තාක්ෂණ සම්බන්ධීකාරක/තාක්ෂණ පුහුණුකරු අතර පොදු පසුබිම අන්‍යයන් විසින් හඳුනා ගෙන තිබේ. (Bibbo සහ Erizans, 2013: Coper, 2015) තව ද ගුරු පුස්තකාලයාධිපතීන් ගණනාවකට පාසලේ විෂයමාලා සංවර්ධනයේ දී ප්‍රබල භූමිකාවක් තිබිණි. එක් ගුරු පුස්තකාලයාධිපතිවරයෙකු විෂයමාලා ප්‍රධානියාගේ භූමිකාව ඉටු කර තිබිණි. Church (2010) සහ Kruger (2015) විසින් තොරතුරු සන්නිවේදන තාක්ෂණ සහ විෂයමාලා විශේෂඥයාගේ වැදගත්කම ද සඳහන් කරන ලදී.

මෙම සොයා ගැනීම්වලින් මතු වූ තවත් අංගයක් වූයේ විදුහල්පතිවරුන් ස්වකීය ගුරු පුස්තකාලයාධිපතීන් ඇගයීමට ලක් කරන දැනුම, ආකල්ප සහ කුසලතාවල පුළුල් පරාසයයි. මෙම ගුරු

පුස්තකාලයාධිපතින්ගේ විදුහල්පතිවරු විසින් අපේක්ෂා කළ පළල සහ ගැඹුර අවශ්‍ය කරන තවත් ඉගැන්වීම් තනතුරක් සිතා ගැනීම දුෂ්කරය.මෙම තනතුර පාසලේ විධිමත් නායකත්ව තනතුරක් නොවුණ ද නායකයෙකුගේ ගුණාංග සහ බලපෑම ගුරු පුස්තකාලයාධිපතීන්ට තිබිය යුතු යැයි බොහෝ විදුහල්පතිවරු අපේක්ෂා කළහ. මෙම ගුණාංග පාසල්වල ගුරු පුස්තකාලයාධිපතීන්ගේ බලපෑම පිළිබඳ විදුහල්පතිවරුන්ගේ සංජානනය සම්බන්ධ Henri සහ Boyd (2002) ගේ ඔස්ට්‍රේලියානු අධ්‍යයනයෙන් ද මෙම ගුණාංග අනාවරණය කෙරිණි. එමෙන් ම විදුහල්පතිවරු අන්තර්පුද්ගල කුසලතා ඉහළින් අගය කළ බව Kaplan (2006) සහ Shannon (2009) යන දෙදෙනා ම අනාවරණය කළහ.

## නිගමනය

විදුහල්පතිවරුන් ගුරු පුස්තකාලයාධිපතීන්ගේ ඉගැන්වීම් භූමිකාව අගය කළ බව ද ස්වකීය ගුරු පුස්තකාලයාධිපති පළමුව ගුරුවරයෙකු ලෙසත් දෙවනුව පුස්තකාලයාධිපති ලෙසත් දුටු බව ද මෙම අධ්‍යයනයේ ප්‍රතිඵලවලින් අනාවරණය කෙරේ. මෙහි ගුරු පුස්තකාලයාධිපතීන් සඳහා අනුමිතීන් ගණනාවක් තිබේ. ඔස්ට්‍රේලියාවේ දී ගුරුවරුන් ඇගයීමට ලක් කරනුයේ ඉගැන්වීම සහ පාසල් නායකත්වය සඳහා වන ඔස්ට්‍රේලියානු ආයතනයේ ගුරුවරුන් සඳහා ඇති වෘත්තීය ප්‍රමිතිවලට අනුවය. (Australian Institute for Teaching and School Leadership, 2014) මෙම ප්‍රමිති සූචක නොවන අතර පාසල් පුස්තකාලයාධිපති, පාසල් උපදේශනයේ යෙදෙන්නා සහ වෘත්තීය උපදේශනයේ යෙදෙන්නා වැනි පාසලේ විශේෂඥ භූමිකාවක් සමග ගුරුවරුන් හැඳින්වීමක් නොකරයි. මෙයින් අදහස් වන්නේ මෙම ප්‍රමිති සපුරා ගැනීමට ගුරු පුස්තකාලයාධිපතීන් ස්වකීය ව්‍යවහාරය පරිවර්තනය කළ යුතු බවය. ඉගැන්වීම සහ විෂයමාලා සමෝධානය වෙතට ස්වකීය ක්‍රියාකාරකම් බර නොතැබුවහොත් පුස්තකාල කළමනාකරුගේ භූමිකාවේ ප්‍රධාන වශයෙන් යෙදෙන ගුරු පුස්කාලයාධිපතිවරයෙකුට තමන් අතිරික්තයක් යැයි පෙනෙනු ඇත. එවිට ගුරු පුස්තකාලයාධිපතීන්ට ඇති අභියෝගය වන්නේ ගුරු පුස්තකාලයාධිපති තනතුරට සහ එම භූමිකාවට හානිදායක ලෙස බලපාන සාධක පරාසය ආමන්ත්‍රණය කිරීමය. ගුරු පුස්තකාලයාධිපතීන් තම පාසල්වලට අප්‍රමාණ ආකාරයෙන් වටිනාකම එකතු කරන බව මෙම අධ්‍යයනයේ ප්‍රතිඵලවලින් තහවුරු වේ. විදුහල්පති සමග මනා සබඳතාවක් ඇති කර ගැනීම, පූර්ව ක්‍රියාකාරී වීම, අන්තර් පුද්ගල කුසලතා සහ නවෝත්පාදක ව්‍යවහාර පරාසයක් විදහා දැක්වීම, තොරතුරු සන්නිවේදන තාක්ෂණ විශේෂඥතාව පෙන්වීම, විෂයමාලා සංවර්ධනයේ දී සහයෝගීත්වය දැක්වීම මගින් සහ විශේෂඥ ගුරුවරයෙකු වීම මගින් ඔවුන්ගේ තත්ත්වය ඉහළ නංවා ගත හැකිය.

---

**මෙම ලිපිය ජාත්‍යන්තර පාසල් පුස්තකාලයාධිපතින්ගේ සංගමය** (International Association of School Librarianship - IASL) **වෙතින්, ගෙවීමක් නොකර අවසර ලබාගෙන පරිවර්තනය සිදු කරන ලදී. මෙහි අන්තර්ගතය තවදුරටත් භාවිතා කිරීමට අවශ්‍ය නම්, ඒ සඳහා ජාත්‍යන්තර පාසල් පුස්තකාලයාධිපතින්ගේ සංගමයෙන්** (International Association of School Librarianship - IASL) **අවසර ලබාගත යුතුය.**

## *References*

ACARA. (2014). The Australian curriculum. Retrieved from http://www.australiancurriculum.edu.au/
Alexander, L., Smith, R., & Carey, J. (2003). Education reform and the school library media specialist: Perceptions of principals. *Knowledge Quest, 32*(2), 10-13.
American Association of School Librarians, & Association for Communications and Technology. (1988). *Information power: Guidelines for School library media programs*. Chicago, IL: American Library Association.
American Association of School Librarians, & Association for Communications and Technology. (1998). *Information power: Building partnerships for learning.* Chicago, IL: American Library Association.
American Library Association. (2010). AASL votes to adopt the professional title school librarian Retrieved
from http://www.ala.org/news/news/pressreleases2010/january2010/adopt_aasl
Ash-Argyle, R., & Shoham, S. (2012). Librarians' leadership efficacy, training, and school involvement: Collaboration between teachers and school librarians in Israel. *School Libraries Worldwide, 18*(1), 1-17.
Australian Institute for Teaching and School Leadership. (2014). Professional standards for teachers. Retrieved from http://www.aitsl.edu.au/australian-professional-standards-forteachers/ standards/list
Barnett, C. (2015). The more things change the more they stay the same. *Knowledge Quest, 43*(4), 30-38.
Bibbo, T., & d'Erizans, R. (2013). The future of the librarian as a meta-data specialist. *International Schools*
*Journal, 33*(1), 46-53.
Campello, B. (2014). School libraries and school librarianship in Brazil. Paper presented at the International
Association of School Librarianship.
Church, A. (2007). *Elementary school principals' perceptions of the instructional role of the school library media*
*specialist.* Unpublished doctoral dissertation, Virginia Commonwealth University, Virginia, USA.
Church, A. (2008). The instructional role of the library media specialist as perceived by elementary school
principals. *School Libraries Media Research, 11*. Retrieved from
http://www.ala.org/aasl/sites/ala.org.aasl/files/content/aaslpubsandjournals/slr/vol11/SLMR_InstructionalRole_V11.pdf
Church, A. (2009). The principal factor. *Library Media Connection*, May/June, 40-41.
Church, A. (2010). Secondary school principals' perceptions of the school librarian's instructional role. *School*
*Library Research, 13*. Retrieved from
http://www.ala.org/aasl/sites/ala.org.aasl/files/content/aaslpubsandjournals/slr/vol13/SLR_SecondarySchool_V13.pdf
Church, A., Dickinson, G., Everhart, N., & Howard, J. (2012). Competing standards in the education of school librarians. *Journal of Education for Library and Information Science, 53*(3), 208-217.
Commonwealth of Australia. (2011). School libraries and teacher librarians in 21st century Australia. Canberra: Retrieved from
http://www.aph.gov.au/parliamentary_business/committees/house_of_representatives_committees?url=ee/schoollibraries/report.htm.
Cooper, O. P. (2015). How ISTE's Standards for Technology Coaches inform AASL's Standards for School
Librarians. *TechTrends, 59*(3), 48-52.
Dorrell, L., & Lawson, L. (1995). What are principal's perception of the school library media specialist? *NASSP Bulletin, 79*(October), 72-80.
Easley, M., & Yelvingtom, M. (2015). What's in a name: Reimagining the school library program. *Teacher Librarian, 42*(5), 21-23.
Edwards, K. (1989). Principal's perceptions of librarians. *School Library Journal,* January, 28-31.
Gavigan, K., & Curry Lance, K. (2015). Everybody's teacher: Administrators' and teachers' perceptions of school librarians. *Teacher Librarian, 43*(1), 8-11.
Henri, J., & Boyd, S. (2002). Teacher librarian influence: Principal and teacher librarian perspectives. *School Libraries Worldwide, 8*(2), 1-17.

Hughes, H., Leigh, T., Osbourne, M., Fraser, S., Kahl, C., & Reynolds, H. (2013). School libraries, teacherlibrarians
and literacy at Gold Coast schools: Research findings. *Synergy, 11*(2). Retrieved from http://www.slav.vic.edu.au/synergy/volume-11-number-2-2013/research/331-school-librariesteacher-librarians-and-literacy-at-gold-coast-schools-research-findings.html
Kachel, D. (2015). The calamity of the disappearing school libraries. Retrieved from http://theconversation.com/the-calamity-of-the-disappearing-school-libraries-44498
Kaplan, A. (2006). *Benign neglect: Principals' knowledge of and attitudes towards school library media specialists.*
Unpublished doctoral dissertation, University of Delaware
Klais, M., & Bugher, K. (2010). Helping administrators recruit and support school library information specialists. *Library Media Connection*, October, 22-23.
Krueger, M. (2015). *The unseen school leader: A study of media specialists and their roles.* Unpublished Master's
thesis, St Cloud State University.
Lo, P., Dukic, D., Chen, J., Youn, Y, Hirakue, Y., Nakashima, M., & Yang, G. (2014). Attitudes and selfperceptions
of school librarians in relation to their professional practices: a comparative study
between Hong Kong, Shanghai, South Korea, Taipei, and Japan. *School Libraries Worldwide, 20*(1), 52-69.
Oberg, D., & Henri, J. (2005). The leadership role of the principal in the information literate school community. In J. Henri & M. Asselin (Eds.), *The information literate school community 2: Issues of leadership* (pp. 79-92). Wagga Wagga, NSW: Centre for Information Studies, Charles Sturt University
Queensland Department of Education and and Training. (2014). Independent public schools. Retrieved from
http://education.qld.gov.au/schools/independent-public-schools/
Shannon, D. (2009). Principals' perceptions of school librarians. *School Libraries Worldwide, 15*(2), 1-22.Shannon, D. (2012). Perceptions of school library programs and school librarians. *Teacher Librarian, 39*(3), 17- 22. Shu, C. (2014). *Examining the educational role of school librarians in Hong Kong, Taiwan and mainland China: A
comparative study.* Hong Kong, China: University of Hong Kong.
VanTuyle, V., & Watkins, S. (2012). Teacher librarians as connectors to the school CEO. *School LibrariesWorldwide, 18*(1), 111-122.

## ***Author Note***

Dr Mandy Lupton is a Senior Lecturer in the Faculty of Education, Queensland University ofTechnology. She teaches units in the Master of Education (Teacher-Librarianship) program. She is a regular blogger and presenter. Her research interests include inquiry learning, information literacy, connected learning, and use of social media in teaching and learning.

උපග්‍රන්ථය : භූමිකා සහ පොදු අංගවල සාරාංශය

| | සිසුන් | ගුරුවරුන් | නායකත්වය සහ කළමණාකරණය | විදුහල්පතිට සහාය වීම | ගුණාංග |
|---|---|---|---|---|---|
| සුපිරි පුද්ගලයා | 1.ගුරුවගකීම් සැපයීම. | 1.සමඉගැන්වීම. | 1.උපායමාර්ගික ඇතුළු නුවණ | 1.පොළොවට සවන් තැබීම | 1.දැකීම |
| | 2.කියවීම වර්ධනය කිරීම. | 2.විෂයමාලා සැලසුම්කරණය. | 2.පුළුල් දැක්ම | 2.පුළුල් දැක්ම | 2.පුළුල් ඉගැන්වීම් අත්දැකීම්, පළපුරුදු ගුරුවරයා සහ ගුරු පුස්තකාලයාධිපති |
| | 3.පර්යේෂණ කුසලතා වර්ධනය. | 3.තොරතුරු සන්නිවේදන තාක්ෂණ සුසාධ්‍යකාරක | 3.ඔස්ට්‍රේලියානු විෂයමාලාව ගැන සමස්ත දැක්ම | 3.මනා උපදෙස් සැපයීම | 3.ඔස්ට්‍රේලියානු විෂයමාලාව ගැන මනා අවබෝධය |
| | 4.පුස්තකාලයේ වැඩ කටයුතු සිදුවන අයුරු සිසුන්ට ඉගැන්වීම. | 4.විමසුම්ඉගෙනුම් ක්‍රමවිද්‍යාත්මක විශේෂඥ | 4.ව්‍යාපෘති ගොඩ නැංවීම | | 4.ශක්තිමත් තොරතුරු සන්නිවේදන තාක්ෂණ කුසලතා සහ ඉගැන්වීම් ක්‍රමවිද්‍යාත්මක දැනුම |
| | | 5.වෘත්තීය සංවර්ධනය සැපයීම | 5.තොරතුරු තාක්ෂණ සම්බන්ධීකාරක සම්පත් කළමනාකරණය කිරීම. | | 5.බහු කාර්යයේ යෙදෙන්නා |
| | | | | | 6.නම්‍යශීලී වීම,සංවිධිත වීම, හාස්‍ය ගැන හැඟීම |
| | | | | | 7.ළමයින් සමග වැඩ කිරීමෙන් විනෝද වීම |
| | | | | | 8.සහයෝගිත්වය හා පොදු වගකීම සහිත පරිපරිපූර්ණ පුද්ගලයා |

| | | | | | |
|---|---|---|---|---|---|
| විශේෂඥ ගුරුවරයා | 1.NAPLAN ලකුණු ඉහළ නංවයි. | 1.සමඉගැන්වීම් කරයි. | 1.තොරතුරු සන්නිවේදන තාක්ෂණ ඉගැන්වීම් ක්‍රම විද්‍යාව | 1.මනා උපදෙස් සැපයීම | 1.පළමුව ගුරුවරයා, දෙවනුව පුස්තකාලයාධිපති |
| | 2.කියවීම වර්ධනය කරයි | 2.තොරතුරු සන්නිවේදන තාක්ෂණ කුසලතා සංවර්ධනය කරයි. | 2.තොරතුරු සන්නිවේදන තාක්ෂණ සම්බන්ධිකාරක | 2.තීරණ ගැනීමට සහාය වීම | 2.විශේෂඥයා, පළපුරුදු ගුරුවරයා |
| | 3.සාක්ෂරතාව සහ ගණිත හැකියාව වර්ධනය කරයි | 3.තොරතුරු සන්නිවේදන තාක්ෂණ ඉගැන්වීම් ක්‍රම විද්‍යාව සංවර්ධනය කරයි. | 3.සාක්ෂරතා මුල පිරීම | 3.අදහස් සැපයීම | 3.විෂයමාලාව දනී. |
| | | | 4.පුස්තකාලය කළමනාකරණය කිරීම | | 4.අන්තර්පුද්ගල කුසලතා |
| | | | | | 5.නායකත්වයට සූදානම |
| | | | | | 6.ගුරුවරයාගේ අවශ්‍යතා සහ ශෛලීන් අනුගත කළ හැකි වීම |
| | | | | | 7.පූර්ව ක්‍රියාකාරී වීම |
| අභියෝග කරන්නා | 1.තොරතුරු සාක්ෂරතාව සංවර්ධනය කරයි. | 1.සහයෝගිත්වය දක්වන අතර සම ඉගෙනුමෙහි යෙදෙයි. | 1.පාසලේ ඉගැන්වීම් ක්‍රම විද්‍යාත්මක රාමුව ක්‍රියාත්මක කරයි. | 1.දැක්ම ක්‍රියාත්මක කිරීමට සහාය වේ | 1.කෙටි සම්මුඛ සාකච්ඡා සහ ප්‍රතිචාර නොමැත. |
| | 2.ඩිජිටල් පුරවැසිභාවය සංවර්ධනය කරයි. | 2.තොරතුරු සන්නිවේදන තාක්ෂණයන් සංවර්ධනය කරයි. | 2.වෙනසට පහසු කම් සලසයි. | 2.ඉදිරියට යාම සඳහා කාර්යමණ්ඩලයට සහාය වේ. | |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | 3.පාසලේ ඉගැන්වීම් රාමුව පිළිබඳ දැනුම | |
| සම්බන්ධක | 1.සාක්ෂතතාව සංවර්ධනය කරයි. | 1.ඉගැන්වීම් ක්‍රමවිද්‍යාත්මක සුසාධ්‍යකාරකයා | 1.පාසල සමඟ එක පෙළට සිටී. | 1.අගුරු ආකරයේ කහ ආලෝකය | 1.විශේෂඥ ගුරුවරයා |
| | 2.තොරතුරු සන්නිවේදන තාක්ෂණය සංවර්ධනය කරයි. | 2.විෂයමාලා විශේෂඥයා | 2.පාසලේ සිසුන් හා ගුරුවරුන් සමඟ සම්බන්ධ වෙයි. | 2.කාර්යමණ්ඩලය යහ පැවැත්ම | 2.නම්‍යශීලී ජනතා පුද්ගලයා |
| | 3.සිසුන්, අදහස් සම්පත් සහ සාහිත්‍යයට සම්බන්ධ කරයි. | 3.ගුරුවරුන් සම්පත්වලට සම්බන්ධ කරයි. | 3.වෙනස වෙනුවෙන් පෙනී සිටී. | 3.සබඳතා සහ බැඳීම් සපයයි. | 3.තොරතුරු සන්නිවේදන තාක්ෂණ ඉගැන්වීම් ක්‍රම විද්‍යාත්මක ප්‍රවීණත්වය |
| | | 4.තොරතුරු සන්නිවේදන තාක්ෂණය සංවර්ධනය කරයි. | | | 4.සාහිත්‍යයට ඇල්ම |
| | | 5.මොඩලයක් වෙයි. | | | 5.ඉගෙනුම සඳහා දැක්ම |
| | | | | | 6.පර්යේෂකයා සහ ඉගෙනුම්කරුවා |
| | | | | | 7.දේශපාලනික සුහුරු බව |
| | | | | | 8.පුද්ගලයන් තාක්ෂණය සමඟ සම්බන්ධ කරයි. |
| විෂයමාලා නායකයා | 1.පාඩම් සබඳතා සපයයි. | 1.සමඉගැන්වීම කරයි. සහයෝගිත්වය දක්වයි. | 1.විෂයමාලා සංවර්ධනය මෙහෙයවයි. | 1.පංති කාමරය සමඟ සබඳතාව සපයයි. | 1.විෂයමාලා නායකයා |
| | 2.සාක්ෂරතාව සංවර්ධනය කරයි. | 2.විෂයමාලා සංවර්ධනයට සහයෝගය දක්වයි. | 2.ඉගැන්වීම් ක්‍රමවිද්‍යාත්මක සංවර්ධනය මෙහෙයවයි. | 2.විෂයමාලාව සහ ඉගැන්වීම් ක්‍රමවිද්‍යාව සාකච්ඡා කරයි. | 2.නව තාක්ෂණයන් භාවිත කරයි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | 3.විෂය සමගාමී සහ විෂය බාහිර ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කරයි. | 3.සම්පත් සපයයි. | | 3.අදහස් සපයයි. | 3.ඉහළින් යාම සහ ඉක්මවා යාම සිදු කරයි. |
| | | 4.විෂයමාලා සුසාධ්‍යකාරකයා | | | 4.වෘත්තිමය ලෙස නිරන්තරයෙන් අලුත් වෙයි. |
| | | 5.ඉගැන්වීම් ක්‍රම විද්‍යාත්මක පුහුණුකරු | | | 5.පෙරමුණෙහි සිටී. |
| කළමනාකරු | 1.තොරතුරු සාක්ෂරතාව සංවර්ධනය කරයි. | 1.සම ඉගැන්වීම කරයි. | 1.කාර්යමණ්ඩලයට බලපායි. | 1.ඩිජිටල් චිත්‍රය සපයයි. | 1.ශක්තිමත් කළමනාකරණ කුසලතා |
| | 2.සිසුන්ගේ පර්යේෂණ ව්‍යාපෘති සම්බන්ධීකරණය කරයි. | 2.තොරතුරු සන්නිවේදන තාක්ෂණ වෘත්තීය සංවර්ධනය සපයයි. | 2.සීමා ඉදිරියට තල්ලු කරයි. | 2.කාර්යමණ්ඩලය සහ සිසුන් පිළිබඳ තොරතුරු සපයයි. | 2.සීමා ඉදිරියට තල්ලු කරයි. |
| | 3.සිසුන් විශේෂඥයන් සමග සම්බන්ධ කරයි. | 3.වෘත්තීය උපදෙස් සපයයි. | 3.පුස්තකාලය කළමනාකරණය කරයි. | 3.අදහස් සපයන අතර වෙනස්වීම් ක්‍රියාත්මක කරයි. | 3.පුද්ගල වෘත්තීය සංවිධානය ක්‍රියාත්මක කරයි. |
| | 4. තොරතුරු වෙත ප්‍රවේශය සපයයි. | 4.සම්පත් සපයයි. | | 4.ක්ෂේත්‍රයේ වෘත්තීය ව්‍යවහාර පිළිබඳ තොරතුරු සපයයි. | 4.සක්‍රීයව ජාලගත වෙයි. |
| | | | | | 5.පූර්ව ක්‍රියා කාරී බව |
| | | | | | 6.නායකත්වය සහ බලපෑම |
| ගුරුවරයා | 1.තොරතුරු සාක්ෂරතාව සංවර්ධනය කරයි. | 1. සම ඉගැන්වීම කරයි. සහයෝගිත්වය දක්වයි. | 1.නායකත්ව හෝ කළමනාකරණ කාර්ය හෝ ගුණාංග ප්‍රදර්ශනය නොකරයි. | 1.සිසු ඉගෙනුම වර්ධනය කරයි. | 1.විශිෂ්ට ගුරුවරයා |

| | | | | | |
|---|---|---|---|---|---|
| | 2.ඩිජිටල් පුරවැසිභාවය සංවර්ධනය කරයි. | 2.විෂයමාලා සැලසුම්කරණය සමඟ සහයෝගි වෙයි. | | | 2.කණ්ඩායම් ක්‍රීඩකයා |
| | 3.කියවීම සහ අදහස් ගැන ඇල්ම සංවර්ධනය කරයි. | | | | 3.පූර්ව ක්‍රියාකාරී |
| ගුරුවරයා නොවීම | 1.ප්‍රශ්නයක් විමසීමට බලා සිටී. | 1.කාර්යමණ්ඩලය සමඟ අන්තර් ක්‍රියාකාරී නොවේ. | | 1.අන් තැනක භාවිත කළහැකි සම්පත් ගණින් බලයි. | 1.පූර්ව ක්‍රියාකාරී |
| | | | | | 2.ඉගෙනුමට කැමති දක්ෂ හා උද්‍යෝගී |
| | | | | | 3.ප්‍රබල තොරතුරු සන්නිවේදන තාක්ෂණ කුසලතා |